# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2276/57 – 2022 අප්‍රේල් 22 වැනි සිකුරාදා – 2022.04.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය.*: BD/BD/LND/3/5/19/1370.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවයේ විස්තර:*

බදුල්ල වෙන්කල් අඩි මාර්ගයේ සංවර්ධන කටයුතු සඳහා ඉඩම් අත්පත් කර ගැනීම.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රිල්පොල කෝරළේ සුළු කොට්ඨාසයේ බදුල්ල ග්ලේන්ඇල්පින් 80 - එච්, උඩවෙල 80 ඩී, වේවැස්ස 80ජේ වැදිගුණ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අ. ග. පි. 170 අතිරේක 62 හා පත්‍ර අංක 57 හා 2015.12.31 දිනැති අවසන් ගම් පිඹුරේ කැබලි අංක 1370 ලෙසින් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් 0.0019 ක් වූ පහත විස්තර සඳහන් ඉඩම් කැබැල්ල.

**1. කැබලි අංක 1370**

ඉඩමේ නම: - ; ඉඩම් පරිහරණය: මහා මාර්ගය; හිමිකම් කියන්නා: හිමිකම් කියන්නා සොයා ගත නොහැක; උතුරට: කැබලි අංක $2^{W7}$ $2^{WB}$; නැගෙනහිරට: කැබලි අංක $2^{WB}$ සහ 1374; දකුණට: කැබලි අංක 1374, 1375; බටහිරට: කැබලි අංක 1371, 1369, 1368 සහ 1366; ප්‍රමාණය: හෙක්. 0.0019; වෙනත්: බදුල්ල - වෙන්කල්අඩි මාර්ගය පුළුල් කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට අවශ්‍යව ඇත.

ඉහත සඳහන් ඉඩමට, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2022.05.18 වැනි දින අපරභාග 2.30ට බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 2022.05.11 වන දිනට මත්තෙන් මෙම ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තර ඇතුලත්ව වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටි මා වෙත පිටපත් 02ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඩී. එම්. එල්. එච්. දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
බදුල්ල.

2022 අප්‍රේල් මස 20 වැනි දින,
බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 04- 0125